පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சித் திணைக்களம் (மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. LGD/2A/පොදු | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2020.03.21 |

බස්නාහිර පළාත්
සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත.

**<u>ඇඳිරි නීතිය බලපැවැත්වෙන කාලසීමාව තුළ අත්‍යවශ්‍ය සේවා සඳහා පළාත් පාලන ආයතනවල නිලධරයන් හට රාජකාරි වාර්තා කිරීම සඳහා අවසර ලබාදීම සම්බන්ධව යි.</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ (බස්නාහිර පළාත) අංක LGD/2A/පොදු දරන හා 2020.03.20 සහ වැඩ බලන පොලිස්පතිතුමාගේ අංක CRTM-1319 හා 2020.03.21 දාතමැති ලිපි හා බැඳේ. (මෙහි පිටපත මේ සමග යාකොට ඇත.)

02. ලංකාව පුරා පැතිර යන Covid-19 හෙවත් කොරෝනා වෛරසය මැඩ පැවැත්වීමේ අරමුණින් මුලු දිවයිනට ම බලපාන පරිදි ඇඳිරි නීතිය පනවා ඇති බැවින් අත්‍යවශ්‍ය රාජකාරි සඳහා වාර්තා කිරීමට ඊට අදාළ නිලධරයන්ට ශ්‍රී ලංකා පොලිසිය විසින් අවසර ලබාදී ඇත. එබැවින් සියලු ම පළාත් පාලන ආයතනයන්හි නිලධරයන් හට රාජකාරියට වාර්තා කිරීමේ දී වැඩ බලන පොලිස්පති විසින් නිකුත් කළ ලිපියෙහි පිටපතක් අවසර පත්‍රය ලෙස භාවිත කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

03. තව ද මෙම ව්‍යසනකාරී තත්ත්වය පාලනය කිරීම සඳහා යොදවා ඇති සෞඛ්‍ය කාර්යාංශ හා ශ්‍රී ලංකා පොලිසියට බාධාවක් නොවන පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

කසුන් ඇප හෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත) | - | කාරුණික දැ.ගැ.ස. |
| 02. | පළාත් පාලන ලේකම් (බස්නාහිර පළාත) | - | කාරුණික දැ.ගැ.ස. |
| 03. | බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ඊ.එච්.ඩබ්.දේශබන්දු තෙන්නකෝන් මහතා | - | කාරුණික දැ.ගැ.ස. |
| 04. | පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) | - | පළාත් පාලන ආයතන හා සම්බන්ධීකරණය සඳහා |



| ලිපිනය / முகவரி/Address | අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | පොදු General | කොමසාරිස් Commissioner | පාලන හා මානව සම්පත් Admin / HR | නීති Legal | සැලසුම් Planning | ගිණුම් Accounts | විමර්ශන Investigation | ආයතන පරිපාලන Establishment | ප්‍රජා සංවර්ධන Community Development |
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |
| ෆැක්ස් / தொலைநகல்/ Fax | 2092577 | වෙබ් ලිපිනය/ இணையதளம்/Web | www.lgd.wpc.gov.lk | ඊමේල් / மின்னஞ்சல்/ Email | lgd@wpc.gov.lk | | | | |